## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>දිවයින පුරා සිසුන් 150කට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමේ</u>

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම විසිර සිටින උසස් පෙළ සිසුන් 150 දෙනෙකු සඳහා 2018-19 වර්ෂය සඳහා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමීම පෙබරවාරි 11 වන දින ගරු අධ්‍යාපන අමාත්‍ය ජී.එල්. පීරිස් මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා අතින් බත්තරමුල්ලේ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේදී සිදු විය.

මෙම අවස්ථාවේ දී අමාත්‍ය ජී.එල්. පීරිස් මැතිතුමා මහත්මා ගාන්ධි මැතිතුමාගේ වටිනා අදහස් හා එතුමා පසුගිය සියවසේදී අවිහිංසාවාදය අවියක් කොට ගෙන ප්‍රබල බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහිව නැගී සිටි ආකාරය පිළිබඳව ඉතා ප්‍රශංසනාත්මකව අදහස් දැක්වීය. මෑතකදී යාපනය සහ කිලිනොච්චි ප්‍රදේශයේ සිදු කළ සංචාරයන් පිළිබඳව සිහිපත් කරමින් විවිධ ජන වර්ගයන්ට අයත් ජනතාව එම ප්‍රදේශයන්හි සාමූහිකව ජීවත් වන බව ප්‍රකාශ කළ එතුමා වැඩිහිටියන් බවට පත් වූ විට එය ආදර්ශයට ගෙන ජීවත් වෙන්නැයි සිසු දරුවන්ගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධනයට ඉන්දියාව ලබා දෙන සහයෝගයට අමාත්‍යතුමා ඉන්දීය රජයට සිය ස්තුතිය පළ කළේය.

ලබාගත් ජයග්‍රහණයට සුබ පැතුම් එක් කරමින් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ ඉන්දීය ජනතාව, ඉන්දීය රජය සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු සමස්ත ජනතාව සමඟ සැමවිටම සිටින බවයි. මහ කොමසාරිස්තුමා බුදුන් වහන්සේ සහ මහත්මා ගාන්ධිතුමා පිළිබඳව ද කරුණු දැක්වූ අතර මහත්මා ගාන්ධිතුමාගේ පරමාදර්ශයන් වේගයෙන් වෙනස් වන නවීන ලෝකයට පවා වලංගු වන බව සඳහන් කළේය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමීප සංස්කෘතික සබඳතා පවතින බව සිහිපත් කළ එතුමා අධ්‍යාපනය අතින් මෙන්ම රැකියා අතින් ද විශාල රටක් වන ඉන්දියාවේ පවතින අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගන්නැයි තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාවේ තරුණ ශිෂ්‍ය ප්‍රජාව ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අනාගතයට දැඩි ශක්තියක් වනු ඇතැයි එතුමා විශ්වාසය පළ කළේය.

මහත්මා ගාන්ධි ශිෂ්‍යත්වයන්ට අමතරව, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලාංකික සිසුන්ට ඉංජිනේරු, තාක්ෂණ, කලා, විද්‍යා, පරිපූරක වෛද්‍ය සහ දේශීය වෛද්‍ය යන ක්ෂේත්‍රයන්හි වාර්ෂිකව ශිෂ්‍යත්ව 750ක් පමණ ලබා දේ. **“Study in India”** නමැති වැඩසටහන යටතේ ඉන්දියාවේ කීර්තිමත් අධ්‍යාපන ආයතන රැසක ඉගනුම ලැබීමට අවස්ථා දහස් ගණනක් ද ශ්‍රී ලාංකික සිසුන්ට හිමි වේ.

ශිෂ්‍යත්ව වැඩසටහන් සහ වෙනත් අධ්‍යාපන අධාර පිළිබඳ වැඩිදුර විස්තර සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවිය වන www.hcicolombo.gov.in වෙත පිවිසෙන්න.

****

Colombo
February 12, 2021